# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2022 අංක 40 දරන අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 නොවැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 නොවැම්බර් මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 10.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2022 අංක 40 දරන අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 නොවැම්බර් මස 17 වන දින]

එල්.ඩී.— ඕ. 47/2021

**(49 වන අධිකාරය වූ) අන්තරායකර සත්ත්ව ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 40 දරන අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (49 වන අධිකාරය වූ) අන්තරායකර සත්ත්ව ආඥාපනතේ 7 වන වගන්තිය, එහි (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් දහසක්" යන වචන වෙනුවට "රුපියල් දෙලක්ෂ පනස්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 49 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "අධිකරණය එම ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ඇත." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

> "අධිකරණය එම ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ඇත:
>
> එසේ වුව ද, ලියාපදිංචි පශු වෛද්‍යවරයකු හෝ ලියාපදිංචි පශු වෛද්‍ය වෘත්තිකයකු හෝ 1956 අංක 46 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික පනතේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වෙනත් යම් තැනැත්තකු විසින් එම සත්ත්වයාට වේදනාවක් හෝ විඳවීමක් රහිතව මානුෂීය ආකාරයකට පමණක් එම සත්ත්වයා විනාශ කිරීම සිදු කළ යුතු ය.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.